**පානදුර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 05 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 13 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ එකතුව රු.1,582,710 ක් වූ වත්කම් විෂයයන් 4 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණයහිමියන් සඳහා ගෙවා තිබූ රු.1,382,182 ක් කර්මාන්ත ණයහිමි ගිණුම හර කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස සළකා කර්මාන්ත වැය ගිණුම හර කර තිබීමෙන් කර්මාන්ත ණයහිමි ශේෂය හා කර්මාන්ත වැය එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මූලධන ආධාර හා ගෙවිය යුතු කර්මාන්ත වියදම් (කර්මාන්ත ණයහිමි) රු.29,338,163 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) විදුලි ගබඩා සහ පොදු ගබඩා තොග ගිණුම්වලට වර්ෂයේ මිලදී ගැනීම් හා නිකුත් කිරීම් ගිණුම් ගත කර අවසාන තොග ශේෂය ලබා ගත යුතු වුවත් මිලදී ගැනීම් පිළිවෙලින් රු.3,665,678 ක් හා රු.4,271,728 ක්ද, නිකුත් කිරීම් පිළිවෙලින් රු.3,379,374 ක් හා රු.3,134,870 ක් ගිණුම් ගත නොකර වර්ෂය අවසානයේ භෞතික තොග ශේෂය ගිණුමේ අවසාන ශේෂය ලෙස දක්වා ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ගලපා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය උපලේඛනය අනුව ශේෂය සහ ලෙජර ගිණුම අනුව සේවක ණය ශේෂය සමාන කිරීම සඳහා ජර්නල් සටහනක් මගින් රු.516,626 ක් සේවක ණය ගිණුම හර කර ඌනතා හා අතිරික්තතා ගිණුම් බැර කර තිබුණද ඊට අදාල හේතු අනාවරණය කර ගෙන නොතිබුණි.

(ඊ) පළාත් පාලන කොමසාරිස්ගෙන් ණය පදනම මත සභාවට ලබා දී තිබූ රු.3,178,456 ක් වූ කැබ් රථයේ වටිනාකම ණය ගිණුමට ගිණුම් ගත කිරීම හා එහි වාරික ගෙවීම් රු.706,272 ක් 2014 අගෝස්තු 20 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියේ දක්වා ඇති ගිණුම්තැබීම් උපදෙස් අනුව ණය ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

1.3.2 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.1,717,893 ක් වූ පෙර ගෙවුම් ශේෂය, වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.134,899 ක් වූ අභ්‍යන්තර ණය ශේෂය සහ රු.2,500 ක් වූ සේවක ඇප තැන්පතු ශේෂය සමාලෝචිත වර්ෂයේදීද හඳුනාගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.46,445,192 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,342,720 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 20,618 | 18,328 | 19,653 |
| (ii.) | බදු කුලී | 1,394 | 1,400 | 694 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 552 | 532 | 26 |
| (iv.) | වෙනත් ආදායම් | 2,181 | 1,026 | 3,779 |

2:2:2 වරිපනම් බදු

--------------

2013 දෙසැම්බර් 31 දිනට සභාවට අයත් උප කාර්යාල 3 හි දේපල 42465 කින් රු.25,436,320 ක වරිපනම් ශේෂයක් හිඟව පැවති අතර විගණිත දිනය වූ 2014 ජනවාරි 28 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:3 <u>ව්‍යාපාර බදු</u>

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විට වාද්දුව උප කාර්යාල බල ප්‍රදේශයට අදාල ව්‍යාපාර 43 කින් රු.118,940 ක්ද, කෙසෙල්වත්ත උප කාර්යාල බල ප්‍රදේශයට අදාල ව්‍යාපාර 206 කින් රු.338,828 ක් ද, තන්තිරිමුල්ල උප කාර්යාල බල ප්‍රදේශයට අදාල ව්‍යාපාර 79 කින් රු.84,380 ක ව්‍යාපාර බදු හිඟ ශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත් ව්‍යාපාර 21 කින් රු.20,080 ක් වූ ව්‍යාපාර බදු හිඟ ශේෂයක් විය. ව්‍යාපාර වසා ඇති බව ව්‍යාපාර බදු ලේඛනයේ සටහන් කර තිබූ අතර සභා අනුමැතියකින් තොරව ලේඛනයෙන් කපා ඉවත් කර තිබුණි.

2:2:4 **කර්මාන්ත බදු**

වාද්දුව, කෙසෙල්වත්ත හා තන්තිරිමුල්ල යන උප කාර්යාලවලින් 2013 දෙසැම්බර් 31 දින වන විට රු.95,960 ක කර්මාන්ත බදු ශේෂයක් හිඟව පවතින නමුත් 2014 ජනවාරි 28 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:5 **වෙළඳ බලපත්‍ර**

2013 වර්ෂයට වෙළඳ බලපත්‍ර ලබා නොගත් වාද්දුව උප කාර්යාලයේ ව්‍යාපාර 4 කින් රු.10,200 ක්ද, කෙසෙල්වත්ත උප කාර්යාලයේ ව්‍යාපාර 15 කින් රු.11,500 ක්ද, තන්තිරිමුල්ල උප කාර්යාලයට අයත් ව්‍යාපාර 96 කින් රු.20,860 ක වෙළඳ බලපත්‍ර හිඟ ශේෂය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:6 **කඩකුලී**

(අ) වාද්දුව උප කාර්යාලයට අයත් පැරණි කඩ කාමර 3 ක හා අදියර I, II හා III ට අදාල කඩ කාමර 6 ක හිඟ කුලී රු.76,161 ක් අයකරගැනීමට 2014 සැප්තැම්බර් 30 වන විටත් කටයුතු කර නොතිබුණි. මින් පැරණි කඩ කාමර එකකින් 2010 දෙසැම්බර් සිට 2013 දෙසැම්බර් දක්වා අය නොවී පැවත එන ශේෂය රු.18,832 ක්ද, I අදියර කඩ කාමරයකින් 2008 අගෝස්තු සිට 2013 දෙසැම්බර් 31 දක්වා හිඟව පැවත එන ශේෂය රු.44,729 ක් ද විය. නීත්‍යානුකූලව කටයුතු කර මෙම හිඟ ශේෂ අයකරගැනීමට හෝ කඩ කාමර පවරා ගැනීමට හෝ සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත් කඩ කාමර 25 කට අදාල රු.579,650 ක හිඟ ශේෂය තුළ 2006, 2010, 2011 සිට අය නොවී පැවත එන කඩ කාමර 07 ක ශේෂයන් පිළිවෙලින් රු.66,000, රු.96,600, රු.88,200, රු.29,250, රු.19,500, රු.28,350 ක් හා රු.28,350 ක් විය.

(ඇ) 1982 හා 1986 වර්ෂයන් තුළ එළඹ තිබූ කඩ කාමර ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබූ අතර 2003 වර්ෂයෙන් පසු කුලිය සම්බන්ධව තක්සේරුවක් සිදු කර කුලී සංශෝධනයක්ද සිදු කර නොතිබුණි.

2.2.7 **ඉඩම් විකිණීම මත බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් විකුණනු ලබන විට හෝ වෙන්දේසි කරනු ලබන විට එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් සභාව විසින් අයකර ගත යුතු වුවත් 2013 වර්ෂයේ ඉඩම් විකිණීම් 3 කින් 1% ක බදු මුදල වශයෙන් රු.318,979 ක ප්‍රමාණයක් අයකර තිබුණි. එම මුදල ඇස්තමේන්තුගත මුදලින් 1% ක් වූ අතර කිසිදු අවස්ථාවක ඉඩමේ විකුණුම් වටිනාකමින් 1% ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.8 **ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ අනුමත ආයතනවලින් බලපත්‍ර ගාස්තු අයකිරීම**

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ අනුමත හෝටල්, ආපනශාලා, නවාතැන්පොල ආදායමින් 1% ක් නොඉක්මවන ප්‍රමාණයක් බලපත්‍ර ගාස්තු ලෙස අයකරගත යුතු වුවත් සභා බල ප්‍රදේශයට අයත් හෝටල් 3 කින් 2013 වර්ෂය සඳහා එකී බදු මුදල් 2014 සැප්තැම්බර් 30 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ii) බලපත්‍ර ගාස්තු අයකිරීමේදී එම ආයතනවලින් ලබා දී තිබූ විස්තර මත පමණක් පදනම්ව බලපත්‍ර ගාස්තු ගණනය කර අයකර තිබූ අතර නියම වශයෙන් බලපත්‍ර ගාස්තු අයකළ යුතු ආදායම කොපමණද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

2.2.9 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 5,793,362 |
| (ii) | මුද්දර ගාස්තු | 22,761,728 |

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 අවිධිමත් ගනුදෙනු
-----------------------

2012 සිට 2013 දෙසැම්බර් දක්වා සභාපති, උප සභාපති හා මන්ත්‍රීවරුන්ගේ නිවාස සඳහා දිනපතා හා සති අන්ත පුවත්පත් සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේදී රු.57,020 ක් හා 2013 දී රු.153,135 ක් වශයෙන් එකතුව රු.210,155 ක් කිසිදු අනුමැතියකින් තොරව සභා අරමුදලින් ගෙවා තිබුණි. මෙම වියදම සභාපතිගේ නිවස සඳහා පුවත්පත් 1642 ක්ද, උප සභාපතිගේ නිවස සඳහා පුවත්පත් 646 ක්ද, මන්ත්‍රිවරුන් 15 දෙනෙකු සඳහා පුවත්පත් 6195 ක්ද සැපයීම වෙනුවෙන් විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන (2013) යටතේ දකුණු මොල්ලිගොඩ මූණමල්ගහවත්ත මාර්ගය දිග මීටර් 70 ක් හා පළල මීටර් 3 කින් යුක්තව කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීමේ අදියර 2 හි අවසන් ගෙවීම් වාර්තාව අනුව ගල්කුඩු දමා සකසන ලද මාර්ගය මත කුට්ටිගල් එලා කුස්තුර පුරවා තලා සකස් කිරීම සඳහා රු.29,284 ක් ගෙවා තිබුණද කුස්තුර පිරවීම සිදු කර නොතිබූ අතර මාර්ගයේ අවසාන මීටර් 30 තුළ ගල් සෙලවෙමින් පැවතුන බව 2014 පෙබරවාරි 28 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදි අනාවරණය විය.

(ආ) ඉහත වැඩසටහන යටතේම මහ වාද්දුව ගංගාරාම පාර අතුරු මාර්ගය (පීරිස් හාඩ්වෙයාර් අසල මාර්ගය) කොන්ක්‍රීට් කුට්ටි ගල් ඇතිරීම දිග මීටර් 70 ක් හා පළල මීටර් 3 ක් වූ අතර අවසන් ගෙවීම් වාර්තාව අනුව ගල් කුඩු දමා සකසන ලද මාර්ගය මත කුට්ටි ගල් එලා කුස්තුර පුරවා තලා සකස් කිරීම සඳහා රු.29,263 ක් ගෙවා තිබුණද පළමු මීටර් 16 තුළ ගල් කුඩු දමා කුස්තුර පිරවීම සිදු කර නොතිබූ බව 2014 පෙබරවාර් 28 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

(අ) <u>සේවක ණය</u>

(i) සේවකයින් 04 දෙනෙකුගේ රු.330,475 ක් වූ ණය ශේෂයෙන් කිසිදු වාරිකයක් සමාලෝචිත වර්ෂයේදී අයකර නොගෙන ශේෂය ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ii) සේවක ණය උපලේඛන අනුව 2007 ට පෙර සිට අයවිය යුතු එකතුව රු.62,248 ක් වූ ණය ශේෂයන් 13 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම ණය ශේෂ, ණය ලේඛනයේද දක්වා නොතිබුණි.

(ආ) <u>වාහන පාලනය</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වාහනවල මාස 6 කට වරක් ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි.

(ii) වාර්ෂිකව වාහන සම්බන්ධ සමීක්ෂණයක් කර නොතිබුණි.

(iii) දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමේ දිගු ප්‍රමාදයන් වූ අතර දෛනික ධාවන සටහන් කාලීනව ලියා තබා නොතිබුණි.

(iv) 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ත්‍රීරෝද රථය කිලෝ මීටර් 6558 ක් ධාවනය කර තිබුණද ගමන් විස්තර දක්වා නොතිබූ අතර වාහනය පාවිච්චි කළ නිලධාරියාගේ කෙටි අත්සන ද යොදා නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
--------------------------------
සභාපති, උප සභාපති, මන්ත්‍රීවරු 21 දෙනෙක් සහ ලේකම් යන අය තායිලන්තය, මැලේසියාව, සිංගප්පූරුව යන රටවල කසල කළමනාකරණය පිළිබඳ අධ්‍යයනයක් සඳහා දින 08 ක සංචාරයකට සහභාගි වී තිබූ අතර ඒ සඳහා සභා අරමුදලන් රු.6,124,150 ක් වියදම් කර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදේශ සංචාරයක් නිමවා පැමිණ මාස 01 ක් ඇතුළත අදාල සංචාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දිනය වූ 2014 පෙබරවාරි 28 වන විට සංචාරය නිමවා මාස 02 ක් ගත වී තිබුණද සංචාරයට සහභාගි වූ කිසිදු අයෙකු එම වාර්තාව ලබා දී නොතිබුණි.

(ii) අදාල අධ්‍යයනයෙන් ලබා ගෙන තිබූ දැනුම උපයෝගී කරගෙන සභා බල ප්‍රදේශයේ කසල කළමනාකරණය සඳහා සභාව කිසිදු නව වැඩ පිළිවෙලක් ආරම්භ කර නොතිබූ අතර සුපුරුදු පරිදි සභා බල ප්‍රදේශයේ කසල මොරටුව නගර සභා බල ප්‍රදේශයට අයත් කදිරයාන කසල රඳවනයට ගෙන ගොස් දැමීම සිදු කරන බව අනාවරණය විය. මේ සඳහා මොරටුව මහ නගර සභාවට රු.2,751,727 ක් 2013 වර්ෂයේ දී සභාව විසින් ගෙවා තිබුණි.

4. පද්ධති හා පාලන
-------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) වාහන පාලනය
(iv) ව්‍යාපෘති කළමනාකරණය
(v) අයවැයකරණය